අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25A	S	I	ඉන්දියාවේ ඉතිහාසය	කාලය : පැය එකයි Time : one hour

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය 1 හා 11 ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- **1 කොටස** 1-40 දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස්** පරිදි පිළිතුරු සපයන්න.
- 1 කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
- කොටස් **දෙකටම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු 1 කොටස 11 කොටසේ පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

1 1 සුලෙයිමාන් 2 හින්දුකුෂ් 3 බැරෝඩා
4 ආරවල්ලි 5 නිල්ගිරි ( )

2 1 කාවේරි 2 සට්ලෙජ් 3 රාවි
4 චේනාබ් 5 ජේලම් ( )

3 1 ඔස්ට්‍රොලොයිඩ් 2 පරමාර 3 මධ්‍යධරනි
4 මොංගොලොයිඩ් 5 ඇල්පයින් ( )

4 1 කාසි 2 කෝසල 3 මගධ
4 අවන්ති 5 වත්සය ( )

5 1 සාංචි ලිපිය 2 මස්කි ලිපිය 3 ජුනාගාද් ලිපිය
4 සාරානාත් ස්ථම්බ ලිපිය 5 රුම්මින්දෙයි ලිපිය ( )

6 1 මේඝදූතය 2 ප්‍රියදර්ශිකා 3 නාගානන්ද
4 රත්නාවලි 5 හර්ෂචරිතය ( )

7 1 ශක 2 කුෂාණ 3 මෛත්‍රික
4 ඉන්දුග්‍රීක 5 පාර්තියන් ( )

Past Papers Wiki

8	1 නන්දිවර්මන්	2 නරසිංහවර්මන්	3 මාරවර්මන්	
	4 මහේන්ද්‍ර වර්මන්	5 පරමේශ වර්මන්		( )
9	1 උජ්ජෙයිනි	2 නාලන්දා	3 වික්‍රමශිලා	
	4 ඕදන්තපුරි	5 ජගද්දලා		( )
10	1 දෙබාල්	2 තානා	3 ප්‍රතිෂ්ඨාන්	
	4 මුල්තාන්	5 දිල්ලි		( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැළපෙන පද යුගලය හඳුනාගෙන ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

11	1 අජාසත්ත	- හර්යංක	
	2 කනිෂ්ක	- කුෂාණ	
	3 ධනනන්ද	- නන්ද	
	4 අශෝක	- මෞර්ය	
	5 බින්දුසාර	- ගුප්ත	( )
12	1 වංශකථා	- රාජතරංගනි	
	2 නාට්‍ය	- ශාකුන්තලය	
	3 මහා කාව්‍යය	- පංචතන්ත්‍රය	
	4 කාව්‍යය	- රඝුවංශය	
	5 ශබ්දකෝෂ	- අමරකෝෂ	( )
13	1 සෝම	- දිව්‍යමය පානයකි	
	2 ශුල්ක	- රථාචාර්ය	
	3 මන්ත්‍රි පර්ෂද්	- අමාත්‍ය මණ්ඩලය	
	4 සමාහර්ත	- අයකැමි	
	5 සමිති	- ගම් වැඩිහිටියන්ගෙන් සමන්විත වේ	( )
14	1 උජ්ජෙයිනි	- චම්බාල්	
	2 පාඨලිපුත්‍ර	- ගංගා	
	3 භාරුකච්ච	- නර්මදා	
	4 ඉන්ද්‍රප්‍රස්ථ	- සිංදු	
	5 ප්‍රතිෂ්ඨාන්	- ගෝදාවරී	( )
15	1 කවිරාජ	- සමුද්‍රගුප්ත	
	2 වාතාපි කොණ්ඩ	- නරසිංහ වර්මන්	
	3 ගංගෙයියකොණ්ඩ	- පළමුවන රාජෙන්ද්‍ර	
	4 වික්‍රමාදිත්‍ය	- දෙවන චන්ද්‍රගුප්ත	
	5 මදුරෙයි කොණ්ඩ	- දන්ති දුර්ග	( )

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දිනවකවානු X තීරුවේ දි ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. .Y තීරුව X තීරුව සමග ගැලපෙන අනුපිළිවෙල සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16

X	Y
1 මගධය	A බිම්බිසාර
2 අවන්ති	B උදයන
3 කෝසල	C ප්‍රසේනජිත්
4 වත්ස	D පුක්කුසාති
5 ගාන්ධාර	E චන්ඩ පජ්ජෝසන

1 ABCDE 2 ACBED 3 ADBCE 4 AECBD 5 ADBCE ( )

17

X	Y
1 ගද්‍ය කෘතියකි	A කතා සරිත් සාගර
2 වංශකතාවකි	B බෘහද් සංහිතා
3 තාරකා ශාස්ත්‍ර කෘතියකි	C සුශ්‍රුත සංහිතා
4 වෛද්‍ය කෘතියකි	D රාජතරංගනි
5 නාට්‍ය කෘතියකි	E රත්නාවලී

1 ADBCE 2 ABCED 3 ADECB 4 AECBD 5 ADECB ( )

18

X	Y
1 අජන්තා	A පල්ලව රථ
2 මහබලිපුරම්	B හින්දු දේවාල
3 මථුරා	C ගුහාචිත්‍ර
4 නාලන්දා	D බෞද්ධ අධ්‍යාපන ආයතන
5 තංජෝර්	E බුද්ධ ප්‍රතිමා

1 ADCBE 2 BEDCA 3 CAEDB 4 DBAEC 5 ECBAD ( )

19

X	Y
1 කඩුන්ගොන්	A පල්ලව
2 1 පුලකේශින්	B රාෂ්ට්‍රකූට
3 111ගෝවින්ද	C චාලුක්‍යය
4 සිංහ විෂ්ණු	D චෝල
5 විජයාලය	E පාණ්ඩ්‍යය

ADCBE 2 BEDCA 3 CAEDB 4 DBAEC 5 ECBAD ( )

20

X	Y
1 තංජෝරයේ බෘහදීශ්වර දේවාලය	A හොයිසාල
2 එල්ලෝරයේ කෛලසනාථ දේවාලය	B චාලුක්‍යය
3 බදාමියේ විෂ්ණු මහා දේවාලය	C රාෂ්ට්‍රකූට
4 බෙලුර්හි චෙන්නකේශව දේවාලය	D පල්ලව
5 මහබලිපුරම් දේවාලය	E චෝළ

1 ADCBE 2 BEDCA 3 CAEDB 4 DBAEC 5 ECBAD ( )

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාල මාතෘකාවට නොගැලපේ. එම නොගැලපෙන කරුණ තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.

21 ඉන්දුනිම්න සභ්‍යත්වය පිරිහිමට හා බිඳවැටීමට බලපෑ සාදක ලෙස ඉදිරිපත් වී ඇති මතවාද ලෙස

1 ප්‍රධාන නගර දෙක අතර බල අරගල
2 වසංගත රෝග හා ලෙඩරෝග
3 ජල ගැලීම
4 ආර්ය ආක්‍රමණ
5 පාරිසරික වෙනස් වීම් ( )

22 පහත දැක්වෙන වර්ධනයන් ඉන්දියාවේ ශුංග පාලනය යටතේ සිදු විය

1 අධිරාජ්‍ය කැඩිබිඳී විසිරී යාස
2 බ්‍රාහ්මණ ආගමේ පුනර්ජීවනය
3 බුද්ධාගම මර්ධනය කිරීම
4 සංස්කෘත භාෂාව හා සාහිත්‍යයේ පිබිදීම
5 සාංචි ස්තූපය විශාල කිරීම හා නව වාස්තු විද්‍යා අංග එක් කිරීම ( )

23 කණිෂ්ක රජතුමා

1 භීම කැඩ්ෆයිසීස්ගෙන් පසු රජවිය
2 කුෂාණ රජවරුන් අතරින් ශ්‍රේෂ්ඨතම පාලකයාය
3 ඔහු බලයට පත්වූයේ ක්‍රි.ව. 78 දීය
4 මෙම වර්ෂය ශකවර්ෂ ක්‍රමයේ ආරම්භය ලෙස සැලකේ
5 කනෙෂ්ජය අගනුවර කර ගත්තේය ( )

24 නාලන්දා විශ්වවිද්‍යාලය

1 මහායාන බෞද්ධ මධ්‍යස්ථානයකි
2 ගුප්ත අවධියේදී ආරම්භ විය
3 පාල රාජවංශයෙන් අනුග්‍රහය ලැබුණි
4 පාහියං භික්ෂුව අධ්‍යාපනය ලබා ඇත
5 ජාත්‍යන්තර කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයකි ( )

25 පළමුවන චන්ද්‍රගුප්ත

1 ශ්‍රී ගුප්තගේ මුණුපුරා වූ පළමුවැනි චන්ද්‍රගුප්ත ගුප්ත අධිරාජ්‍යය පිහිටුවීමට මුල් වූ පාලකයා ලෙස සලකනු ලබයි

2 පළමුවන චන්ද්‍රගුප්ත දන්තා දේවිය විවාහ කර ගත්තේය

3 මහා රාජාධිරාජ යන විරුදය ලබා ගත්තේය

4 ඉන්දියාව ආක්‍රමණය කළ හූනයන් පරාජය කිරීමට පළමුවන චන්ද්‍රගුප්ත සමත් විය

5 පළමුවන චන්ද්‍රගුප්ත විසින් සමුද්‍රගුප්තට රජකම රාජසභාවේදී ලබා දෙන ලදී ( )

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B),(C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවරදිය. නිවරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තොරන්න.

(A) සහ (B) පමණක් නිවරදි නම්..... 1 ද

(A) සහ (C) පමණක් නිවරදි නම්..... 2 ද

(B) සහ (C) පමණක් නිවරදි නම්..... 3 ද

(C) සහ (D) පමණක් නිවරදි නම්..... 4 ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවරදි නම්..... 5 ද වරහන් තුළ යොදන්න.

උපදේස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
A සහ B පමණක් නිවැරදිය	A සහ C පමණක් නිවැරදිය	B සහ C පමණක් නිවැරදිය	C සහ D පමණක් නිවැරදිය	වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදිය

26 සෘග් වෛදික යුගයේදී

A ගෝත්‍රයේ නායකයා රාජන් විය

B ඔවුන් අනාර්ය ගෝත්‍ර සමග සටන් කලේය

C ආර්යයන් විවිධ ගෝත්‍රවලට බෙදී සිටියහ

D විශාල ජනාවාස පිහිටියේ සප්ත සින්දු ප්‍රදේශයේය ( )

27 මෞර්ය අධිරාජ්‍යයේ පරිපාලන ත්‍රන්තය

A පරිෂා හෙවත් මන්ත්‍රි පර්ෂදය මෙම පාලන ක්‍රමයේ වැදගත් අංගයකි

B කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේ මෞර්ය පරිපාලනය පිළිබඳව සඳහන් වේ

C ප්‍රත්‍යයන්ත කොටස් හයකට බෙදා තිබුනි

D භුක්ති දේශ රාෂ්ට්‍ර මණ්ඩල ලෙස බෙදන ලදී ( )

28 දෙවන චන්ද්‍රගුප්ත රජු

A විවාහ සබඳතා මගින් තම බලය ව්‍යාප්ත කළේය

B ශ්‍රී ලංකාවේ මේඝවර්නාභය රජු සමග සබඳතා පැවැත්විය

C නවරත්න කවීන් රාජ සභාවේ දක්නට ලැබුණි

D මොහු දේවගුප්ත දේවරාජ දේව ශ්‍රී විරුදයන්ගෙන් හඳුන්වා ඇත ( )

29 ඉන්දියාවට එල්ල වූ තුර්කි ආක්‍රමණ

A ඝජ්නි මොහොමඩ්ගේ වැදගත්ම ප්‍රහාරයවන්නේ ක්‍රි.ව. 1025 දී සෝමනාථ දේවාලයට එල්ල කල ප්‍රහාරයයි

B ඝජ්නි මොහොමඩ් පළමු ආක්‍රමණය ක්‍රි.ව.1000 දී ඉන්දියාවේ දේශසීමා නගරවලට එල්ල විය

C හෙතෙම අවුරුදු 25 ක් තුල ආක්‍රමණ 17 ක් එල්ල කලේය

D ඔහු කිසිම ආක්‍රමණයකින් පරාජය නොවීය ( )

30 ශක වරුන්ගේ ආක්‍රමණය සම්බන්ධයෙන්

A ශකවරු ඉන්දියාවට ඇතුලුවුයේ බයිබර් දුර්ගය හරහාය

B බෙංගාලය දක්වා අධිරාජ්‍යය වර්ධනය කිරීමට සමත් විය

C ශකවරුන්ගේ ප්‍රාන්තභාර ආණ්ඩුකාරවරුන් හදුන්වන ලද්දේ ක්ෂත්‍රය ලෙසය

D ඉන්දියාවට පැරණි ශකවරුන්ගේ කණ්ඩායම් හතරක් තක්ෂිලා මථුරා උජ්ජයින් මහාරාෂ්ට්‍ර ක්ෂෙත්‍රනු කොට ගෙන පදිංචි විය ( )

- අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

31 මගධ රාජධානියේ වර්ධනයට දායක නොවූ රාජවංශය කුමක්ද?

1 හර්යංක 2 නන්ද 3 මෞර්ය

4 ශුංග 5 සිසුනාග ( )

32 අවසන් මෞර්ය පාලකයා වූ බෘහද්රථ රජු මරා බලය පැහැරගත් සෙන්පතියා කවුද?

1 ඩිමෙට්‍රියස් 2 මිනැන්ඩර් 3 නහාපාන

4 ඇන්ටියෝකස් 5 පුෂ්‍යමිත්‍ර ශුංග ( )

33 ගුප්ත අධිරාජ්‍ය සමයේ ප්‍රසිද්ධියට පත් වූ ඉන්දියාවේ අධ්‍යාපනික ආයතනය

1 නාලන්දා 2 තක්ෂිලා 3 වික්‍රමශිලා

4 ඕදන්තපුරි 5 වලභි ( )

34 පළමුවන ක්‍රිෂ්ණ රාෂ්ට්‍රකූට රජු ඉදිකරන ලද දේවාලය

1 බෘහදීශ්වර දේවාලය 2 බුවනේශ්වර දේවාලය 3 වෙන්නකේශව දේවාලය

4 කෛලාස දේවාලය 5 විරූපක්ෂ දේවාලය ( )

35 රාෂ්ට්‍රකූටයන්ගේ අගනුවර කුමක්ද?

1 මාන්‍යකේත 2 මදුරයි 3 වාතාපි

4 තංජෝර් 5 කාවේරි ( )

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්න වලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්දයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොදින් ගැළපෙනුයේ පහත වගුවේ දක්වෙන 1/ 2/ 3/ 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

	පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
1	නිවැරදිය	වැරදිය
2	නිවැරදිය	නිවැරදිය
3	වැරදිය	වැරදිය
4	වැරදිය	නිවැරදිය
5	නිවැරදිය	නිවැරදි වන අතර පළමුවැනි ප්‍රකාශය මැනවින් පහදා දෙයි

	පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය	
36	ගුප්ත අධිරාජ්‍යයේ පිරිහිමට බ්‍රාහ්මණ විරෝධ හේතු විය	හූණ ආක්‍රමණ ගුප්ත අධිරාජ්‍යයේ පිරිහීමට බලපෑ ආසන්නතම හේතුවය.	( )
37	කුෂාණ රාජ්‍යඅවධියේ වංශකයන් පශ්චාත් මෞර්ය යුගයේ බලයට පත් දේශිය රාජවංශයකි.	බෞද්ධ මූලාශ්‍රවලට අනුව සිව්වන ධර්ම සංගායනාව පාඨලීපුත්‍රය දී පවත්වා ඇත.	( )
38	ත්‍රිකෝණ අරගලය සිදුවුයේ කෞනජයේ ආධිපත්‍යය උදෙසාය.	ත්‍රිකෝණ අරගලයට සම්බන්ධ වූ රාජවංශ වුයේ ගුර්ජර ප්‍රතිහාර පාල රාෂ්ට්‍රකූට වංශයන්ය.	( )
39	පාල රාජධානිය අටවන සියවස මැද දී බෙංගාලයේ පිහිටුවන ලදී	තමම රාජවංශයේ ආරම්භකයා ගෝපාලය පාල රාජවංශයට වර්තමාන බෙංගාලය බිහාරය අයත් විය. මොවුන් බෞද්ධ පාලකයෝ විය.	( )
40	චෝල රාජවංශයේ පාලකයන්ගේ ක්‍රියාකලාපය හඳුනාගත් ශිලා ලිපිය තිරුමලෙයි ලිපියය	ගංගෙයි කොණ්ඩ මුම්මඩිචෝල පාණ්ඩ්‍ය කුලාශනි විරුද භාවිතා කරන ලදී	( )

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25A S II	ඉන්දියාවේ ඉතිහාසය	කාලය : පැය දෙකයි Time : 2 hours

ඉන්දියාවේ ඉතිහාසය - ඇත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා.

උපදෙස්

- පිළිතුරු සැපයීය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- 11 ප්‍රශ්නපත්‍රය A,B,C කොටස ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටස ප්‍රශ්නය අනිවාර්යය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

A කොටස

01 ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i තක්ෂිලා	ii අජන්තා	iii සුප්පාරක	iv දිල්ලිය
v මධුරෙයි	vi හරප්පා	vii හිමාලය කඳුවැටිය	viii ලෝතාල්
ix සාංචි	x මහානදී	xi ප්‍රයාග	xii බයිබර් කපොල්ල

B කොටස

02 "ඉන්දුනිම්න ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි." මෙම ප්‍රකාශය විචාරාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු 16)

03 සෘග් වෛදික යුගයේ දේශපාලන ආගමික හා සමාජීය තත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 16)

04 "චන්ද්‍රගුප්ත මෞර්ය මෞර්ය අධිරාජ්‍යයේ ප්‍රථම පාලකයා වේ."

i නන්ද රාජවංශයේ අවසාන පාලකයා නම් කරන්න. (ලකුණු 01)

ii චන්ද්‍රගුප්ත මෞර්යගේ අනුප්‍රාප්තික පාලකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

iii චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමා පිළිබඳව අධ්‍යනය කිරීමට තිබෙන සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න (ලකුණු 02)

iv ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? එසේනම් ඒ බව විමර්ශනාත්මකව ලියා දක්වන්න . (ලකුණු 11)

PAST PAPERS WIKI

Past Papers Wiki

05 පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කමපිළිබඳව කෙටි සටහන් ලියන්න.

i වයඹදිග දුර්ගමාර්ග

ii සමුහාණ්ඩු පාලන ක්‍රමය

iii මගධයේ වර්ධනය

iv මෞර්ය යුගයේ පරිපාලන රටාව (ලකුණු 08 × 2 = 16)

C කොටස

06 මෞර්ය යුගයේ අවසානයේ සිට ගුප්ත යුගයේ ආරම්භය දක්වා වයඹදිග ඉන්දියාවේ දේශපාලන තත්වය විචාරාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 16)

07 "සමුද්‍රගුප්ත රජු විසින් ගුප්ත අධිරාජ්‍යය උච්චත්වයට පත් කරන ලදී."

i සමුද්‍රගුප්තගේ කාර්ය සාඵල්‍යය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය නම් කරන්න. (ලකුණු 01)

ii සමුද්‍රගුප්තට පෙර සිටි ගුප්ත පාලකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

iii ගුප්ත අධිරාජ්‍ය සමයේ සාහිත්‍යයේ දියුණුව විස්තර කරන්න. (ලකුණු 03)

iv සමුද්‍රගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයටගෙන ආවේ කෙසේදැයි සාකච්ඡා කරන්න (ලකුණු 10)

08 චෝළ අධිරාජ්‍ය අවධියේ දකුණු ඉන්දියාවේ පැවැතුනු පරිපාලන රටාව සාකච්ඡා කරන්න. (ලකුණු 16)

09 පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i හර්ෂවර්ධන රජතුමා


ii ගුප්ත සාහිත්‍ය

iii හූණ ආක්‍රමණ

iv පාණ්ඩ්‍ය රාජධානිය (ලකුණු 08 × 2 = 16)

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25A S II	ඉන්දියාවේ ඉතිහාසය	කාලය : Time :



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank